**පහන් වැට තුළට විත් දල්වන්න පහනක් සුදිලෙන්න කවියක්ව නුඹේ සිතුවිලි සයුරෙන්**

අන්තර්ජාලය ඔස්සේ සන්නස කවි පිටුව එහා මෙහා යාමේදී ඇති වූ අතපසු වීමක් නිසා පසුගිය කලාපයේදී මෙම කවියෙහි අකුරු වෙනතකට හැරී වැරදී ගොස් තිබුණි. ඒ ගැන අපි ඉතා කණගාටු වෙමු. -සංස්කාරිකා



## ප්‍රණාම

| | |
|---|---|
| ලැබ නිසි බැලුම් සරසවි දේවිය | නෙතිනී |
| මියැසිය වරම් ලැබ ගුරු පිය තුම | අතිනී |
| එතෙරව මහා සමුදුරු සරිගම | පධනී |
| අමයුරු නාද සිතුවම් ඔබ මැව් | රමණී |
| | |
| මඟුලට යන්නවුන් මෙන් රෙදි ණයට | ගෙන |
| සිංහල ගීත දඹදිව තනුවෙන් බැඳුන | සමයක |
| ඔබේ නිවහල් තනු පණ පෙවුන | ගීවල |
| නැවුම් රස තවමත් නැත | ඌන |
| | |
| ඉක්මන් ගමන් ගියද දස්කොන් වැලි | මළුවේ |
| දස්කොන් ගීත දැනුදු සවනේ දේ | රාවේ |
| කතාව හුණුවටයෙ පිරිපුන් | රසභාවේ |
| සංගීතය ගැනත් වියතුන් | කතිකාවේ |
| | |
| අඩ සියවසක ඔබ ගී මල් | මකරන්ද |
| සුවඳින් අදත් රස හදවත් වෙයි | නන්ද |
| කැන්ගරු දෙසට වැඩියේ අප | පිනකින්ද |
| කිවමැන පෙම්රතන ෂෙල්ටන් | ඇදුරින්ද |
| | |
| එක පහනකින් දහසක් හුළු නැගුනු | වැනී |
| සිසු පරපුරක පහන් ටැඹ ඔබ | මිණී |
| අප රුස දෙසට ඔබෙ මෙහෙවර | සමරමිනී |
| පුදනෙමි මෙකව් ෂෙල්ටන් ගුරු | පියාණනි |

**මොරගොඩ මලියසේන**

## සන්නස තෙවර්ෂ පූර්ණයට සුබ පැතුම්!

| | |
|---|---|
| දෙදහස් පහේ බක් මස බිහි වුණ | දියණී |
| ඇය අප වෙතට ආවේ සන්නස | නමිනී |
| දැන් රූබර ළඳකි ගුණ නැණයෙන් | සපිරී |
| කැන්ගරු දේශයට නැතිවම බැරි | කතකී |
| | |
| හෙළ බස නමැති රන් අබරණ | පළඳාලා |
| අධුනික සැමට දිරි දෙන කිරුළක් | පළඳා |
| ලස්සන රූප රාමුව මුල් පිටුවෙ | දරා |
| හැම මාසයකම අප වෙත එන්න | ඔයා |
| | |
| තුන් වසරක් පිරුණු ඔබහට සුබ | පතමී |
| දස අත ඔබෙ කිරණ විහිදේවා | පතමී |
| වෙහෙසෙන හැමට ඔබෙ දියුණුව තුති | පුදමී |
| දිගුකල් වැජඹෙන්න සුන්දර ලෙස | දියණී |

**කමලිකා ගුණරත්න**

# පහන් වැට

හෙට දින
වඩාත්
සරු කර
ගනු වස්,
අපි ඔබට
මෙහි
ඉඩ
සදන්නෙමු.

සංස්කරණය
තුෂාරි ප්‍රියංගිකා

## අපේ ක්‍රිකට් සංග්‍රාමය

| | |
|---|---|
| ඉන්දිය සයුරු රළ පිට රළ තරඟ | නැග |
| කැන්ගරු බිමෙහි සුදු වැලිපර සිඹින | රඟ |
| සුන්දර මිතුරු කම අමතක නොවන | වග |
| පෙන්වන්නේය යළි කළකට පසුව | දිග |
| | |
| ජයගෙන ක්‍රිකට් කුසලානය ඉහළ | පෙළේ |
| පෙර දිනයකදි අගනා මෙහෙවරකි | කළේ |
| පොඩිපැල ඉදිරියෙහි ලොකු ගස් වැටෙන | වෙලේ |
| ජය හඬ නැගුන හැටි මතකයි නමට | හෙළේ |
| | |
| මුල් තැන දිනාගෙන යවමින් දඟ | පන්දු |
| සිරිලක් පිළට කවදත් සිරිකත | කැන්දූ |
| මුරලිගෙ සිනාවට ලොව දන මන | බැන්දූ |
| ලියැවෙයි හෙටත් අද මෙන් තුති ගී | සින්දූ |
| | |
| උණුසුම් තරඟයක වැද දෙපිලම | රත්වේ |
| ඩක්වර්ත් ලුවිස් සමඟින් කව්රුත් | තෙත්වේ |
| ජය හෝ පරාජය එක කෙනකුට | අත්වේ |
| සුහදව අතට අත දී සතුටට | පත්වේ |
| | |
| තුන් කොන් සටන ඇරඹුන මුදු | පෙරසේම |
| අබියෝගයක් විය තරඟය | හැමදාම |
| දිනුවත් පැරදුනත් විඳගෙන | එකසේම |
| අපි ආදරෙයි ලංකා පිළ වෙත | තාම |

**ජගත් වෙත්තසිංහ**

## ළඟින් ඉන්න

ළඟින් ඉන්නට වරම් නැති සඳ
දුරින් පිපිලා හිනැහියන් නුඹ
නුඹෙ වත සිප හමන මඳනල
නුඹෙ සුවඳින් කළඹවයි හද
පහන් දැල්ලට නොදැන පෙම් බැඳ
දැවෙන පළඟැටි ආත්මය ලෙස
චපල නුඹ වෙත පෙම් කරපු හද
දැවී දැවී අළු වෙලා යයි අද

**හසිත රවීන්ද්‍ර**

*පාසල් දැරියක ලියූ මෙම පැදි පෙළ ඇයගේ 'දැක්ම' විදහා දක්වන්නක් යයි මම සිතමි. ඉතා දිගු වුව ද, අප සමාජයේ අදටත් පවත්නා සංවාදාත්මක තේමාවක් කෙරෙහි ඇය අවධානය යොමු කිරීම ද සතුටට කරුණකි. ඇගේ කාව්‍ය නිර්මාණයන්ට දිරි දෙවනු වස් එය එලෙසම පළ කරමු.*

## පොඩි මැණිකෙගෙ සරුංගලය

මල්ලී හා දබර කර
මහා හඬින් කෑ ගහන
මිණි කිකිණි සොලවලා
මහ හඬින් හිනැහිලා
මුළු ලොවම දෙක කරන
පොඩි මැණිකෙ ඇයි නිහඬ?

වෙනදා නම් මෙලහටත්
ඇඳ උඩට ගොඩ වෙලා
මල්ලී හා කොට්ට පොර
ගහ ගහ හඬ දෙවන
මොකද මේ මහ වෙනස
පොඩි මැණිකෙ ඇයි නිහඬ?

වෙනදා නම් මා රැගෙන
වත්ත පහළට ගොහින්
කොළ රැන හා එක්ව
උඩ යවා මා සුළඟෙ
උඩ පනින සිනහසෙන
පොඩි මැණිකෙ ඇයි නිහඬ?

කාමරය ඇතුළේම
පුංචි කොණකට වෙලා
පැදුරකට ගුලි වෙලා
ඇයි ඔයා නිදියන්නේ?
ඔයාගෙ තනියටත්
තව කෙනෙක් ඔනැලු
ඇයි ඉතිං මම ඉන්නේ!
හැමදාම තනි රැකුවෙ
මමනෙ ඇඳ යට ඉඳන්
කට ඇරලා කියන්නකෝ
පොඩි මැණිකෙ ඇයි නිහඬ?

මුළු ගේම කලබලයි
නෑදෑයො යන එනවා
කැවුම් බදිනා සුවඳ
ගම පුරා පැතිරෙනවා
කෙසෙල් කැන් ඉදවලා
කුස්සියේ එල්ලලා
මගුල් ගෙදරක හැඩයි
මනමාලි කවුද බොල?
පහදන්න හනික මට
පොඩි මැණිකෙ ඇයි නිහඬ?

ඔය එන්නෙ ලොකු මැණිකෙ
හනි හනික මේ දෙසට
දැන ගන්න හැකි මටත්
පොඩි මැණිකෙ ඇයි නිහඬ?

'පොඩි දුවේ..! මගෙ දුවේ..
ඔයා දැන් ලොකු ළමේක්!
මින් මනත කිසි තැනෙක
යන්නෙ නැහැ තනියෙන්
කොළ ගැටව් හා එක්ව
නැහැ කතා සිනාවල්
මින් මනත සරුංගල්
ඇරුම බැහැ වෙල් යායෙ
තැන්පත්ව හැසිරෙන්න
ඔයා දැන් ලොකු ළමෙක් '

පොඩි මැණිකෙ ලොකු වෙලා
තහංචිත් පැනවිලා
කෙළි දෙලෙන් ගත කරපු
කාලයත් වියැකිලා
කමක් නැහැ පොඩි මැණිකෙ
තනි වුණත් මා මෙතන
මොකක් හරි හොඳක් ඇති
ඔයාටත් මින් මනත
ඒකනේ මුළු ගේම
මගුල් සිරියක් ගත්තෙ
හිනැහෙන්න පොඩි මැණිකෙ
යෞවනය එළැඹිලා

**චාරින්දා රත්නධීර**
අවු: 16යි
රොක්ස්බර්ග් සිංහල පාසල

## සිතක පෙරළිය

*සිටිනා විට මව් බිම*
*දැනෙනා විට අග හිඟ*
*සිතෙයි නිබඳ*
*මට රට යන්නට ඇත්නම්*

*පැමිණුන කල පිටරට*
*දැනෙනා විට තනිකම දුක*
*සිතෙයි නිබඳ*
*ආපසු යන්නට ඇත්නම්*

**කාන්ති ද සිල්වා**
*කැන්බරා*



## සැඟවුණ අම්හිරි

සොඳුරිය
නුඹ නියඟලා ලතාවෙකි
වුවන මලක් වූ
හද විස පිරුණු



හිරු පිදුවෙ රතු පාට
හෙට මලක් වෙන්නටයි
රත උදුර ගත්තෙ
විස පිරී ගිය හදවතයි

අහස සේදිලා වට
වැස්ස නිල් පාටයි
මෝඩැ' ලේ ගලන
වතුර කළු පාටයි

**ගැමුණු පී. දසනායක**

## මල් මල් මල්

හිරුට හිනැහෙන මල් - සඳුට පිබිදෙන මල්
තනිව පිපි මල් - පොකුරෙ පිපි මල්
බුදුන් පාමුල පිදී සැනහෙන
දහස් පින් සිත් මල්

සුදෝ සුදු හැහැ මල් - නේක පාටැති මල්
ළඟම වදුලක - ඈත උයනෙක
පිපී හිනැහෙන මල්
බුදුන් පා මුල එකට සැනහෙන
දහස් පින් සිත් මල්

රුවින් සපිරුණු මල් - සුවඳ පතුරන මල්
සතන් සිත් මෙත් - කුළුණු පුරවන
සැදැහැවත් බැති මල්
බුදුන් පා මුල පිදී සැනහෙන
දහස් පින් සිත් මල්

වසත් සමයෙත් මල් - සීත සිසිරෙත් මල්
කිසිම දිනයෙක ලුහුඬු නොවෙනා
මුනිඳු පුදයට මල්
ඔබේ උයනේ හිනා වෙන්නට
වරම් ලැබ ගත් මල්

හිත පිපුණු බැති මල් - විකසිතයි හැම කල්
දහම් පදවැල් පිරිත් ගී මල් - සනසවයි සිත් මල්
පිපෙන හැම මල් මියෙන නියතය
අතර සැනහෙන මල්

සිත් නිවන්නට මල් - සිත් සදන්නට මල්
පිං පුරන්නට මෙත් වඩන්නට
උයන පිරිලා මල් - සිත පුරා බැති මල්
සමිඳු පා මුල වැතිර සැනහෙන - පාරමී සිත් මල්

**චන්ද්‍රා සෙනෙවිරත්න**
නවසීලන්තය

## ඈත එපිට නොසිඳෙන කඳුළු

හුළු අතු එළියක් වැනේ ඈතින්
කවුරුද එන්නේ හනිකට
පිරිමි පුළුටක් නැති ගෙට
මේ දෙගොඩහරි යාමයේ

කෙළී පුංචි සන්දියේ
මහා රෑ ගෙට පැන
මැරයන්ට එරෙහි වූ වරදට
බලෙන් ගෙන ගිය
වරදක් නැති
මගෙ සැමියා එනතුරු
මග බලමින්
මේ රෑත් මං එළිපත්තෙ

කුඹුරත් එක්ක හෙට්ටු වී
කෙළිත් නිදි තෙහෙට්ටුවට
වෙළ පහළ මූකලානේ
උඩු බුරුලනා නරි පමණ ද
අදත් මගෙ තනියට??

**නිහාල් රූපසිංහ**

ඔබේ නිර්මාණ එවන්න
email:
sannasanews@gmail.com

## යදම්

*පපුතුරක*
*ජන්ම වූ*
*ආදරය*
*දෝරෙ ගලනා සඳ*
*ඒ පෙමේ මහිමයෙන්*
*නුරා ගී හැඟුමන්*
*හැර යද්දී හදවතම*
*බැඳ... ඒ සිතම*
*පරාජිත බන්ධනයෙන්*
*සවිමත් කළා වෙද*
*විරහා යදමින්*

**නිකිණි පෙරේරා**

**සන්නසට වසර 3 යි.**

## ජාත්‍යන්තර කාන්තා දිනය

*ඔව්!*
*අද දිනනම් අපේ...*
*ඉතිරි දින තුන්සිය හැට හතරම*
*තොපේ....!*

**වර්ණ රසිකා ඒකනායක.**

කියවන්න... ලියන්න... තොරතුරු දැන ගන්න.. www.ketapathpawra.com වෙබ් අඩවියට ගොඩ වෙන්න..
සයිබර් අහසට ඔබේ නිර්මාණත් ඉදිරිපත් කරන්නට කැටපත් පවුරෙන් ඉඩක්.